සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

10 ශ්‍රේණිය

# කතෝලික ධර්මය I

කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ඉශ්‍රායෙල් ජාතිය විවිධ සිද්ධීන් තුළ දෙවියන් වහන්සේ අත්දුටු ආකාරය අඩංගු වන්නේ,
(1) පංච පුස්තකය තුළ ය. (2) එළිදරව් සාහිත්‍යයේ ය.
(3) ගැලවීමේ ඉතිහාසය තුළ ය. (4) ප්‍රඥා සාහිත්‍යයේ ය.

02. මිනිස් ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ ක්‍රියාකාරී වන බව සනාථ වන පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් හඳුන්වන තවත් නමකි,
(1) දේව වේදීය ඉතිහාස කතා (2) ජීවන සහා සම්ප්‍රදාය
(3) ඓතිහාසික කෘති (4) අනාවරණ මූලාශ්‍ර

03. ශුද්ධවූ පාවුලුතුමාගේ දෙවන හා තෙවන ධර්මදූත චාරිකාවලට සම්බන්ධ වූ මෙතුමා,
A - වෛද්‍යවරයෙකි B - චිත්‍ර ශිල්පියෙකි
C - ගණිතඥයෙකි C - ඉතිහාසඥයෙකි
නිවැරදි පිළිතුරු
(1) A, B, D ය. (2) B, C, D ය. (3) A, C, D ය. (4) A, B, C ය.

04. ග්‍රීසියේ අක්කායා නම් ස්ථානයේ රචනා කර ඇති කෘතියකි.
(1) ලූක් සුබාරංචිය (2) හෙබ්‍රෙව් ලිපිය
(3) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියාපොත (4) මතෙව් සුබාරංචිය

05. කිතුනු සංඝ පෞද්ගලිකව හමුවිය නොහැකි අවස්ථාවල ශුද්ධවූ පාවුලුතුමා ලියූ ලිපිවල අන්තර්ගත වූ කරුණු වන්නේ,
(1) දේව ධාර්මික හා එඬේරික උපදෙස් ය. (2) මිනිස් ඉතිහාසය හා එඬේරික උපදෙස් ය.
(3) දේව ධාර්මික බව හා ධර්මිෂ්ඨකම ය. (4) ඉශ්‍රායෙල් ඉතිහාසයේ නැගීම හා වැටීමය.

06. ශුද්ධවූ පාවුලුතුමා සිරගතව සිටින අවස්ථාවේදී එතුමා විසින් පෞද්ගලිකව ලිපියක් ලියන ලද කිතුනු බැතිමතා,
(1) පිලමොන් ය. (2) පේදුරු ය. (3) ජොහාන් ය. (4) ජාකොබ් ය.

07. ශුද්ධ බයිබලයෙහි සංකේත භාවිතයෙන් ලියා ඇති කෘති හඳුන්වන්නේ,
(1) වෙනත් සංදේශ ලෙසය. (2) ද්විතීය පාවුලු සංදේශ ලෙසය.
(3) විශ්ව සංදේශ ලෙසය. (4) එළිදරව්වාදී ග්‍රන්ථ ලෙසය.

08. දානියෙල් ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
(1) විශ්වාසය ස්ථිර කිරීම සඳහා ය. (2) පීඩන යුගයක සැදැහැවතුන් දිරිගැන්වීම සඳහාය.
(3) අධිරාජ්‍යයේ ගැටුම් නිරාකරණය කිරීම සඳහාය. (4) නපුරු බලවේග විනාශ කිරීම සඳහා ය.

09. සලමොන් රජතුමා දවන යාග පූජා දහසක් පුදකල ස්ථානය පිහිටියේ,

(1) අන්තියෝකයෙහි ය. (2) ජෙරුසලමෙහි ය.

(3) බෙතෙල්හි ය. (4) ගිබියොන්හි ය.

10. ජේසුස් වහන්සේව උත්තම පූජකයාගේ මැඳුර වෙත ගෙනයන්නේ,

(1) ජුදයින් අතට පාවාදීමට පෙරය. (2) ජේසුස් වහන්සේව නාඳුනන බව ප්‍රකාශ කළ විටය.

(3) ජුදයින් අතට පාවාදීමෙන් අනතුරුව ය. (4) පසුදා පහන් වන විට ය.

11. හිරු අඳුරු වී රටපුරා අන්ධකාරයක් පහළ වූ අතර දේව මාළිගයේ තිරය දෙකඩව ඉරී යන ලදී. මෙම සිද්ධීන් සම්බන්ධ වන්නේ ජේසුස් වහන්සේගේ,

(1) දුක්ප්‍රාප්තියට ය. (2) උත්ථානයට ය.

(3) ස්වර්ගාරෝහණයට ය. (4) උකුත්වීමට ය.

12. දෙවියන් වහන්සේ ස්වර්ගීය ජීවිතය නමැති නව අහස හා නව පොළව සූදානම් කර ඇත. ඒ සඳහා පෙරනිමිත්ත වන්නේ ජේසුස් වහන්සේගේ,

(1) මරණය ය. (2) ස්වර්ගාරෝහණය ය.

(3) උත්ථානය ය. (4) දුක්විඳීම ය.

13. A - ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව

B - ජේසුස් වහන්සේ කිසිම චෝදනාවකට වරදකරුවෙකු නොවන බව.

C - ඉශ්‍රායෙල් ජනතාව ජේසුස් වහන්සේව කුරුසපත් කළ බව.

D - ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ සිටින බව.

ඉහත ප්‍රකාශ තුළින් පේදුරු තුමාගේ දේශනයට අදාළ වන්නේ,

(1) A, B, C ය. (2) B, C, D ය. (3) A, C, D ය. (4) A, B, D ය.

14. බෙන්ජමින් ගෝත්‍රයට අයත්ව තාර්සස් හි උපත ලැබූ පාවුලුතුමා විශේෂ වරප්‍රසාදවලට හිමිකරුවකු වූයේ,

(1) ජුදා දහමට ඇලුම්කළ නිසා ය. (2) ගැඹුරු ඥානයක් තිබූ නිසා ය.

(3) රෝම පුරවැසිභාවය නිසා ය. (4) ක්‍රිස්තු අනුගාමිකයින්ට පීඩා කළ නිසා ය.

15. අසහාය ධර්මදූතවරයෙකු වූ පාවුලුතුමා දේව අනාවරණයට නතු වූයේ,

(1) ශුද්ධවූ ස්තේපන්තුමාට ගල්ගසා මරා දැමීමෙනි.

(2) දමස්කස් නගරයට යෑමට අවසර ලබා ගැනීමෙනි.

(3) අනනියස් මගින් ප්‍රසාද ස්නාපනය ලැබීමෙනි.

(4) ගමාලියල් යටතේ අධ්‍යාපනය ලැබීමෙනි.

16. ජේසුස් වහන්සේ පේදුරුතුමාගේ ඔරුවට නැඟී සෙනඟට දහම් පණිවිඩය ප්‍රකාශ කළේ,

(1) ජොර්දාන් ගං ඉවුරේ දී ය. (2) ගෙනසෙරෙත් විල අසල දී ය.

(3) මළ මුහුද අසල දී ය. (4) මධ්‍යධරණී මුහුද අසල දී ය.

17. පිලිප්පි කයිසාරිය නම් පෙදෙසට ගිය අවස්ථාවේදී ජේසුස් වහන්සේ, "මනුෂ්‍ය පුත්‍රයාණෝ කවරෙක්ද කියා මිනිසුන් කියත් දැ" යි යනුවෙන් ප්‍රශ්න කරනු ලබන්නේ,

(1) පේදුරුගෙන් ය. (2) ජාකොබ්ගෙන් ය.

(3) ශ්‍රාවකයන්ගෙන් ය. (4) ජොහාන්ගෙන් ය.

18. 2001 පෙබරවාරි 21 වන දින ශුද්ධවූ දෙවන ජුවාම් පාවුලුතුමන් විසින් කාදිනල් තනතුරට ඔසවන ලද්දේ,

(1) අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන් ය.

(2) අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් ය.

(3) අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් ය.

(4) අති උතුම් XVI වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.

19. ශුද්ධවූ සභාව තුළ පැවතිය යුතු අනිවාර්යය ලක්ෂණ ඇතුළත් යාච්ඤාව වන්නේ,

(1) ස්වාමිවාක් ආරාධනාව යි. (2) උත්තම පූජක යාච්ඤාව යි.

(3) මාංශගතවීමේ අභිරහස යි. (4) විශ්වාස ලක්ෂණය යි.

20. බුවනෙකබාහු රජතුමාගේ ඉල්ලීම පරිදි ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායමට අයත් ධර්මදූතවරු ගණන,

(1) තුනකි (2) හතරකි (3) පහකි (4) හතකි

21. ක්‍රි.ව. 1687 දී ලක්දිව කතෝලිකයින් මුහුණ දුන් ඛේදජනක තත්ත්වයෙන් ඔවුන් මුදවා ගැනීමට දෙවියන් වහන්සේ එවන ලද ගැලවුම්කරුවා වූයේ,

(1) ක්‍රිස්තුන් වහන්සේ ය.

(2) අතිඋතුම් එල්මෝ පෙරේරා රදගුරු හිමිපාණෝය.

(3) ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ය.

(4) භාග්‍යවත් ජුසේවාස් පියතුමා ය.

22. සක්‍රමේන්තු ආකාරයෙන් අපට ලැබෙන දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය යනුවෙන් අදහස් කරන්නේ,

(1) සැබෑ භෝජනය යි. (2) මාංසය හා රුධිරය යි.

(3) රාත්‍රී භෝජනය යි. (4) ආත්මික භෝජනය යි.

23. "මෙල්කිසදෙක්ගේ යාගය" පිළිබඳව සඳහන් ශු. බයිබලීය ග්‍රන්ථය වන්නේ,

(1) උත්පත්ති ය. (2) නික්මයාම ය.

(3) ලෙවී ව්‍යවස්ථාව ය. (4) ගණන් කථාව ය.

24. දිව්‍ය පූජා පිළිවෙතෙහි දක්නට ලැබෙන මූලික ලක්ෂණ ඇතුළත් වන්නේ,

(1) ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්යයේ ය.

(2) කුණාටුව නිශ්චල කිරීමේ ප්‍රාතිහාර්යයේ ය.

(3) ලාදුරු රෝගියා සුව කිරීමේ ප්‍රාතිහාර්යයේ ය.

(4) පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යයේ ය.

25. පාස්කු භෝජනයේ වැදගත් තැනක් හිමිවූයේ,

(1) තිත්ත පලාවලට ය. (2) පාස්කු බැටළුවාට ය.

(3) මිදියුෂවලට ය. (4) නුමුහුන් රොටීවලට ය.

26. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගීවන්නන් ප්‍රේමයේ පනත ජීවත් කළ යුතු බව දැක්වෙන සිදුවීම වන්නේ,

(1) ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනා කිරීම ය.

(2) ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤා කිරීම ය.

(3) ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින්ගේ පාද සේදීම ය.

(4) ජේසුස් වහන්සේගේ උතුත්වීම ය.

27. යාග පැවැත්වීමේ එක් පරමාර්ථයකි.

(1) දෙවියන් වහන්සේට ගරු කිරීම. (2) දෙවියන් වහන්සේට තුති පිදීම.

(3) නික්මයාම සිහිපත් කිරීම. (4) පාපවලට වන්දි ගෙවීම.

28. A - පෝලන්තයේ දී උපත ලැබීම.

B - ජුදා සිනගෝගයකට වැඩම කරන ලදී.

C - "සත්‍යය" නැමැති ලිපිය නිසා අත් අඩංගුවට පත් විය.

D - "බලාපොරොත්තුවේ එළිපත්ත" නැමැති ග්‍රන්ථය රචනා කරන ලදී.

ඉහත ප්‍රකාශ අතරින් ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමාට සම්බන්ධ වන්නේ,

(1) A, B, C ය. (2) B, C, D ය. (3) A, C, D ය. (4) A, B, D ය.

29. අවුරුදු හතේ දී තම පියාගේ වියෝව නිසා පිය සෙනෙහස වෙනුවට දෙව්පිය සෙනෙහස වෙත වඩාත් සමීප වූයේ,

(1) භාග්‍යවත් තෙරේසා මව්තුමිය යි. (2) ශුද්ධවූ තෙරේසා තුමිය යි.

(3) ශුද්ධවූ මරියගොරෙත්ති තුමිය යි. (4) ශුද්ධවූ ඇග්නස් තුමිය යි.

30. "මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" යන සංවිධානයේ කාර්යයන් සඳහා උපකාරී වූ සඟරාව වන්නේ,

(1) වීර සෙබලා (2) සත්‍යය (3) සිතුවිලි (4) දැක්ම

31. "එකම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කිරීම පාපී ඇල්මෙන් ජීවත් වන මිනිසාව එයින් නිදහස් කිරීමට යොමු කරවයි." මෙම ප්‍රකාශය සඳහන් වන්නේ,

(1) කොරින්ති ලිපියේ ය. (2) නික්මයාම ග්‍රන්ථයේ ය.

(3) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි ය. (4) කතෝලික සභා ධර්මෝපදේශයෙහි ය.

32. දෙවියන් වහන්සේට ප්‍රේමය හා ගෞරවය දැක්වීමේ සළකුණකි.

(1) යාග ඔප්පු කිරීම. (2) භක්ති අභ්‍යාස පැවැත්වීම

(3) මූලධර්මවාදීන් පසුපස නොයෑම. (4) බාරහාර හා පොරොන්දු ඉටු කිරීම.

33. දේව යහපත්කමට විරුද්ධ පාපයකි.

(1) අනුමානය (2) ඉච්ඡාභංගත්වය (3) ක්‍රෝධය (4) අලසකම

34. දෛනික ජීවිතයේ දී තමාගේ ශක්තිය පිළිබඳව පමණට වඩා නොසිතා දේව කැමැත්ත ඉටු කිරීම තුළ අයිති කරගත හැකි දේව ධර්මගුණයකි.

(1) ප්‍රේමය (2) විශ්වාසය (3) බලාපොරොත්තුව (4) ඉවසීම

35. තම පියාට ගෞරව කරන තැනැත්තාට දීගායු ලැබෙන බව සඳහන් ග්‍රන්ථය වන්නේ,

(1) හිතෝපදේශය ය. (2) ධර්මදේශකයා ය.

(3) උපදේශකයා හෙවත් සිරාක් ය. (4) ප්‍රඥාව ය.

36. පිළිසිඳගත් මොහොතේ සිට ජීවිතය දෙවියන් වහන්සේට අයිති බව තහවුරු කරන ශුද්ධ ලියවිලි පාඨ සහිත බයිබලීය ග්‍රන්ථ දෙක වන්නේ,

(1) නික්මයාම හා යෙසායා ය. (2) ජෙරමියා හා දානියල් ය.

(3) නෙහෙමියා හා ආමොස් ය. (4) ජෙරමියා හා ගීතාවලිය ය.

37. පොතිපර්ගේ බිරිඳට අතවර කිරීමට උත්සාහ කළ බවට බොරු චෝදනා නගමින් ජෝසෙප්ව රජුගේ සිරගෙයි දමන ලද්දේ,

(1) පාරාවෝ රජු විසිනි. (2) පොතිපර්ගේ බිරිඳ විසිනි.

(3) මිසර ජාතික පොතිපර් විසිනි. (4) මුර සෙබලුන් විසිනි.

38. ප්‍රසාද ස්නාපනය ලැබූ සියල්ලන්ම මයාඩ්ෂව සඳහා කැඳවා ඇති බව තමන්වහන්සේගේ ම ආදර්ශය පෙරටු කොටගෙන ප්‍රකාශ කළේ,

(1) ගෝලයන් තෝරා ගැනීමේ දී ය. (2) කන්ද උඩ දේශනාවේ දී ය.

(3) අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ දී ය. (4) පාළුකරයේ දී ය.

39. "යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේනම්, ඔහුට සතර ගුණයක් ආසු දෙමි." මෙම ප්‍රකාශය කරනු ලබන්නේ,

(1) ක්‍රිස්තුන් වහන්සේ ය. (2) ස්නාවක ජොහාන්තුමා ය.

(3) අනනියස් හා සපිරා ය. (4) සකේවුස් ය.

40. ශුද්ධාත්ම මංගලෝත්සවය සමරන ඉරුදිනට පසුදින සිට ආගමන සමයේ පළමු ඉරුදිනට පෙර දින දක්වා කාලය අයත් වන්නේ,

(1) සාමාන්‍ය සමය පළමු අදියරට ය. (2) සාමාන්‍ය සමය දෙවන අදියරට ය.

(3) චතාරික සමයට ය. (4) ආගමන සමයට ය.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **කතෝලික ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) (i) පුරාණ ගිවිසුමේ නීති පොත් ගණයට අයත්වන පොත් දෙකක් නම් කරන්න.

(ii) ජනප්‍රිය ඓතිහාසික කෘති දෙක සඳහන් කරන්න.

(iii) වෙනත් හසුන් හඳුන්වන තවත් නම් දෙකක් ලියා දක්වන්න.

(iv) ප්‍රඥා සාහිත්‍යයේ අරමුණ හා එහි අධ්‍යාත්මිකත්වය තුළ අවබෝධ කරදෙන කරුණු දෙක ලියන්න.

(v) ජුදයින් අතට පත් වූ ජේසුස් වහන්සේව විනිශ්චය කිරීම සඳහා යොමු කළ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.

(vi) "නව අහස හා නව පොළොවට" ඇතුළුවීමට සුදුස්සන් වීම සඳහා ජීවත් විය යුත්තේ කෙසේද? කරුණු 02 ක් ලියන්න.

(vii) නොදවන පූජා සඳහා භාවිතා කරන ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(viii) දරිද්‍රතාවය හේතු කොටගෙන පීඩා විඳින ජනතාව වෙනුවෙන් ගරු. මයිකල් රුදිගු පියතුමා පිහිට වූ වාසස්ථානයේ නම සහ එය අයත් රදගුරු පදවිය නම් කරන්න.

(ix) ජනවන්දනාවේ ප්‍රධාන අංග දෙකක් ලියා දක්වන්න.

(x) කිතුනු සභා ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් දෙක ලියන්න. (ලකුණු $2 \times 10 = 20$)

02 (i) ශුද්ධ බයිබලයේ ඉතිහාස පොත් ගණන සඳහන් කර එහි අඩංගු වී ඇති කරුණ කුමක්දැයි ලියා දක්වන්න.

(ii) ශුද්ධවූ පාවුලුතුමා විසින් ම රචනා කළ ලිපි තුනක් සඳහන් කරන්න.

(iii) දස පනත අනුසාර කරමින් ජීවත්වීම තුළ අප සැමට දේව ආශිර්වාදය ලැබෙන බව ඔබ ලද අත්දැකීමක් ඇසුරුකර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

03 (i) එළිදරව්ව සඳහා යෙදෙන ග්‍රීක වචනයේ අර්ථ දෙක ලියා දක්වන්න.

(ii) යුගාන්තවාදය තුළ පැහැදිලි වන කරුණු තුනක් ලියන්න.

(iii) විලාසිතාවලට මුල්තැන දෙමින් ආගමික සංකේත හැල්ලුවට ලක්කරන වත්මන් තරුණ පරපුරට දිය හැකි උපදෙස් පහක් පැහැදිලි කරන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

04 (i) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගීවීමේදී මුල් කිතුනු සංසය ප්‍රේමය හා සේවය අතපසු කර ඇති බව ප්‍රකාශ කරන්නේ කවුරුන්ද? කාහටද?

(ii) "පනතක් මම ඔබට දෙමි" යන ගීතිකාවේ සඳහන් අප විසින් අත්හළ යුතු කරුණු තුනක් ලියන්න.

(iii) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පංගුකාරයන් වන අප ක්‍රිස්තුන් වහන්සේමෙන් පරිත්‍යාගිවීම අත්‍යවශ්‍ය බැවින් ඒ සඳහා ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න කරුණු පහක් යටතේ ලියා දක්වන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

05 (i) නිර්මල සිතක් හා පිවිතුරු දිවියක් ගත කිරීමට අනුසාර කළ යුතු දේව පනත් දෙක ලියන්න.

(ii) එම දේව පනත්වලට විරුද්ධ ක්‍රියා තුනක් ලියා දක්වන්න.

(iii) හත්වන සහ දහවන පනත් අනුසාර කරමින් දිවි ගෙවීමට අප කෙසේ වගබලා ගත යුතුද යන්න කරුණු පහක් යටතේ ලියා දක්වන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

06 (i) ජනවන්දනා වසර දේව ජනතාවට උපකාරී වන්නේ කුමක් සඳහා ද?

(ii) ජනවන්දනා වසරට අනුව ජනවාරි මාසයේ පවත්වනු ලබන මංගල්‍යයන් තුන නම් කරන්න.

(iii) ආගමන සමය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීම සඳහා සැබෑ ජීවිත පෙරළියක් ඇති කරගත යුතු බැවින්, ඒ සඳහා කිතුනු අපගේ සූදානම කෙසේ විය යුතුද යන්න කරුණු පහක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

07 කැමති මාතෘකා දෙකක් යටතේ කෙටි සටහන් ලියන්න.

(i) ශුද්ධවූ පාවුලුතුමා

(ii) ශුද්ධවූ මරිය ගොරෙත්තිතුමිය

(iii) දේව ප්‍රසාද නිධාන

(iv) සීනයි ගිවිසුම (ලකුණු $5 + 5 = 10$)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | (10/02) | 09 | 4 | (10/15) | 17 | 3 | (10/30) | 25 | 2 | (10/50) | 33 | 2 | (10/69) |
| 02 | 1 | (10/02) | 10 | 3 | (10/19) | 18 | 3 | (10/33) | 26 | 3 | (10/52) | 34 | 3 | (10/69) |
| 03 | 4 | (10/05) | 11 | 4 | (10/21) | 19 | 4 | (10/34) | 27 | 4 | (10/55) | 35 | 3 | (10/78) |
| 04 | 3 | (10/05) | 12 | 3 | (10/22) | 20 | 3 | (10/38) | 28 | 4 | (10/58) | 36 | 4 | (10/85) |
| 05 | 1 | (10/07) | 13 | 3 | (10/24) | 21 | 4 | (10/39) | 29 | 1 | (10/59) | 37 | 3 | (10/88) |
| 06 | 1 | (10/08) | 14 | 3 | (10/26) | 22 | 2 | (10/45) | 30 | 1 | (10/61) | 38 | 2 | (10/91) |
| 07 | 4 | (10/10) | 15 | 3 | (10/26) | 23 | 1 | (10/46) | 31 | 4 | (10/66) | 39 | 4 | (10/97) |
| 08 | 2 | (10/11) | 16 | 2 | (10/30) | 24 | 4 | (10/47) | 32 | 4 | (10/68) | 40 | 2 | (10/110) |

(ල. 40)

## II පත්‍රය

(01) (i) උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කථාව, ද්විතීය නීති සංග්‍රහය (10/01)

(ii) රූත්, එස්තර් (10/02)

(iii) කතෝලික සංදේශ, විශ්ව සංදේශ, සාමාන්‍ය හසුන් (10/08)

(iv) දෙවියන් වහන්සේට ප්‍රියමනාප දිවියක් ගත කිරීම, සමාජ පරිපාලනය මෙන්ම ජීවිතයේ අරුත හා සීමාවන් පිළිබඳව (10/17)

(v) ආණ්ඩුකාර පිලාත්, හෙරෝද් ඇන්ටිපස් (10/19,20)

(vi) පාපී ක්‍රියා අත්හැරීම, යාච්ඤාවෙන් හා පරිත්‍යාගයෙන් ජීවත් වීම. (10/22)

(vii) පිටි, ධාන්‍ය, හාල්, මිදියුෂ, පූප (10/55)

(viii) සුබසෙත් ගෙදර - බදුල්ල රදගුරු පදවිය (10/62)

(ix) දිව්‍ය පූජාව, දේව ප්‍රසාද නිධාන, යාම යැදුම (10/105)

(x) පිළිගත් කිතුනු සභා, මූලධර්මවාදී සභා (10/123)

02 (i) 16 - විවිධ සිද්ධීන් තුළ ඉශ්‍රායෙල් ජාතිය දෙවියන් වහන්සේ අත්දුටු ආකාරය (10/02)

(ii) රෝම, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, පිලිප්පි, 1 තෙසලෝනික, පිලෙමොන් (10/08)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

03 (i) සැඟව තිබූ යමක් ප්‍රකාශ වීම/ අනාවරණය වීම (10/11)

(ii) පරම යහපත හා පරම අයහපත අතර ගැටුම / දිනකදී පරම යහපත ජයග්‍රහණය කිරීම / සියලු නපුරු බලවේග විනාශ වීම/ ඇදහිලිවන්තයින් උදෙසා සෞභාග්‍යවත් කාලයක් උදාවීම. (10/11)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

04 (i) ශුද්ධවූ පාවුලුතුමා කොරින්ති සභාවට (10/52)

(ii) උඩඟු වීම, කළ කී දේ ගැන උදම් ඇනීම, නොහොබිනා ගති, ඉසිකෝ දුර්ගුණ (10/53)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

05 (i) 6 - කාමමිථ්‍යාචාරය නොකරව, 9 - පරදාර ආලය නොකරව (10/88)

(ii) 10/91 පිටුව

(iii) සිසුන් ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

06 (i) ක්‍රිස්තුන් වහන්සේ පාස්කු අභිරහස හා ගැලවීමේ කාර්යය සදාතනිකව සිහිපත් කිරීම / සැබවින්ම එය ජීවත් කරවීම. (10/106)

(ii) පාරිශුද්ධ දේවමාතා මංගල්‍යය / රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය / භාග්‍යවත් ජුසේවාස් මුනි මංගල්‍යය. (10/107)

(iii) සිසුන් ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

07 (i) 10/26 - 29 දක්වා පිටු

(ii) 10/89 පිටුව

(iii) ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.

(iv) ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.